

2024

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
உணவு ஆணையாளர் திணைக்களம்
FOOD COMMISSIONER'S DEPARTMENT

කාර්ය සාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
Performance Report

කාර්ය සාධන වාර්තාව 2024

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

පටුන

1.	ආයතනික පැතිකඩ	3-9
2.	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10
3.	මූල්‍ය කාර්ය සාධනය	11-35
4.	කාර්ය සාධන දර්ශක	36
5.	තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය	37
6.	මානව සම්පත් පැතිකඩ	38
7.	අනුකූලතා වාර්තාව	39-46

(01) ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වෙළඳ , වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ පවතින ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දැක්ම වන්නේ "ආරක්ෂිතව , අඛණ්ඩව , පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම" යන්නයි. 1942 දී ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම , ගබඩා කිරීම හා මිළ නියම කිරීම පිළිබඳ බල අධිකාරිය මෙම දෙපාර්තමේන්තුවට පවරා දී තිබුණි. 2006 පෙබරවාරි මස 08 දිනැති අමප/06/0238/218/010 යටතේ වූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු දේපළ හා උපකරණ ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරියට පැවරීමට තීරණය කර තිබුණි. එසේ වුවද ජාත්‍යන්තර වශයෙන් ඇතිවූ ආහාර අර්බුදයත් එයින් ඇති විය හැකි අනාගත ආහාර සැපයීමේ අවිනිශ්චිතතාවයත් සැලකිල්ලට ගෙන වෙළඳ අලෙවි සංවර්ධන සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2008 අගෝස්තු මස 11 දිනැති ටීඑම්එම්සී/2008/18 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කර තිබූ අතර එය 2008 අගෝස්තු මස 27 දිනැති අමප/08/1481/342/016 හා 2008.08.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමත කර තිබුණි. මෙහිදී ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු වත්කම් හා වගකීම් ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරියට පැවරීමට ගනු ලැබූ තීරණය අවලංගු කිරීමත් , දෙපාර්තමේන්තුව සතු ශ්‍රාවස්තිපුර , පොළොන්නරුව, අම්පාර , වේයන්ගොඩ , නාරාහේන්පිට , ඕරුගොඩවත්ත සහ රත්මලාන යන ආහාර ගබඩා සංකීර්ණ හැර අනෙකුත් ගබඩා සහ එම ගබඩා සතු වෙනත් නිශ්චල දේපළ පාලනය කිරීම නැවත තීරණය කරන තුරු දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පැවරීමටත් , සීමිත කාර්ය මණ්ඩලයක් සහිතව ආහාර සුරක්ෂිතතාවය අරමුණු කර ගනිමින් වසරකට සහල් මෙට්‍රික්ටොන් 100,000 ක් ගබඩාකර තබා ගැනීම සඳහා ප්‍රතිව්‍යුහගත කරන ලද ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කටයුතු නැවත ඇරඹීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය 208 දෙනෙකුගෙන් යුතු ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත 2024 වසර සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 119.5 ක් ද ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 314.5 ක් ද මහා භාණ්ඩාගාරය වෙතින් ලැබුණි.

ලෝක ආහාර වැඩසටහන යටතේ ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලැබුණු සහනාධාර බෙදාහැරීමේ කටයුතු 2024 වසරේදී ද සිදු කරන ලද අතර දෙපාර්තමේන්තුව සතු ගබඩා හා නිවාස විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත කුලියට ලබා දීමෙන් 2024 වසරේදී රුපියල් මිලියන 144.5 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට හැකි විය . දෙපාර්තමේන්තුවට අයත් ත්‍රිකුණාමලය ධාන්‍යගම නිවාස සංකීර්ණයෙහි පිහිටි නිවාස ත්‍රිකුණාමල ප්‍රදේශයේ නිවාස නොමැති රාජ්‍ය සේවකයන් හා ප්‍රීමා සමාගමේ සේවකයන් සඳහා සහනදායී කුලී පදනම යටතේ ලබා දී ඇත. මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කිරීම සඳහා 208 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද අතර 2024 වසරේදී තත්‍ය වශයෙන් සේවකයන් 53

දෙනෙකු සේවයේ නිරත විය. එම සේවක මණ්ඩලය උපරිම කාර්යක්ෂමතාවයෙන් කටයුතු කිරීම දෙපාර්තමේන්තුව ලබා ගත් මෙම ප්‍රගතියට ඉවහල් වී ඇති අතර, 2024 වර්ෂය පුරාවටම තම සියලු කටයුතු අඛණ්ඩව හා සාර්ථකව පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

1.2

දැක්ම

"ආරක්ෂිතව,

අඛණ්ඩව ,

පෝෂ්‍යදායී

ධාන්‍යමය ආහාර

සෑම නිවසකටම"

මෙහෙවර

"ධාන්‍යමය ආහාර ද්‍රව්‍යයන්හි වෙළඳපොළ සුලභතාව,

පාරිභෝගිකයාට ළඟාවීමේ පහසුව සහ පාරිභෝගික

මිලදී ගැනීමේ හැකියාව සුරක්ෂිත කිරීම උදෙසා ආහාර

කොමසාරිස් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පාර්ශව,

දෙපාර්තමේන්තුව සතු වත්කම් සහ කාර්යක්ෂම වුත්,

කැපවුත් සේවක සමුහයා සමඟ මනා ලෙස

සම්බන්ධීකරණය මඟින් ආහාර කොමසාරිස්

දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම"

අරමුණු

- මහජනතාවට ධාන්‍යමය ආහාර ද්‍රව්‍ය වළෙඳපොල මිලදී ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම.
- අත්‍යවශ්‍ය අවස්ථාවලදී විදේශ රටවලින් ලැබෙන ආහාර ද්‍රව්‍යමය ආධාර මහජනතාව වෙත බෙදා හැරීමේ කටයුතු සිදු කිරීම.
- රාජ්‍ය අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වලින් සිදුකරනු ලබන වී සහ අනෙකුත් ආහාර ද්‍රව්‍ය වල සැපයුම් ක්‍රියාදාමයන්ට අවශ්‍ය ගබඩා පහසුකම් සැපයීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. **දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො. 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.**
   දකුණු ආසියාතික කලාපීය රටවල හදිසි හා ආපදා සහිත අවස්ථාවලදී ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි මෙ.ටො.8000 ක සහල් සංචිතයක් ශ්‍රී ලංකාව විසින් පවත්වාගෙන යා යුතු බව එකී සංවිධානයේ 16 වන සමුළුවේ දී තීරණය කර ඇත.

2. **වෙළඳපොළ සහල් සුලභතාවය පිළිබඳ සහතික වීම.**
   වෙළඳපොළ සහල් හිඟයන් ඇතිවීම තුළින් ඇතිවිය හැකි මිල උච්ඡාවචනයන් අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය අවස්ථාවන්හිදී වෙළඳපොළට තොග මුදා හැරීම සඳහා දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො. 100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම.

3. **ආයතනය සතු සම්පත් ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීම.**
   දෙපාර්තමේන්තුව සතු ගබඩා ආර්ථික වශයෙන් ඵලදායී ලෙස ලෙස උපයෝජනය කිරීමෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත රජයේ තක්සේරුවට අනුව කුලී පදනම මත ලබා දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වය ලබා දීම.

4. **විද්‍යාත්මක ක්‍රම භාවිතා කරමින් ධාන්‍ය ගබඩා කිරීම සඳහා පහසුකම් සැලසීම.**
   ආහාර ද්‍රව්‍යයන්හි ඉහල ගුණාත්මකභාවය පවත්වා ගනිමින් විද්‍යාත්මක ක්‍රමවේදයක් භාවිතා කරමින් ආහාර ගබඩා කර පාරිභෝගිකයාට ඉහළ ප්‍රමිතියකින් යුතු ආහාර ලබා දීම.

1.4 සංවිධාන ව්‍යුහය


ආහාර කොමසාරිස්
නියෝජ්‍ය ආහාර කොමසාරිස්
ප්‍රධාන ගණකාධිකාරී
සහකාර ආහාර කොමසාරිස්
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
තත්ත්ව පාලන නිලධාරී
වැඩ පරීක්ෂක
ධාන්‍ය සමීක්ෂක
නීති අංශය
සැපයුම් හා සැලසුම් අංශය
තොරතුරු තාක්ෂණ අංශය
ප්‍රවාහන අංශය
පාලන අංශය
තත්ත්ව පාලන අංශය
ගිණුම් අංශය

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ආයතන අංශය
- ගිණුම් අංශය
- සැලසුම් අංශය
- සැපයුම් අංශය
- නීති අංශය
- තොරතුරු තාක්ෂණ අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් නගා සිටුවීමේ වැඩසටහන යටතේ රු. මිලියන 376.7 ක මුදලක් 2020 සහ 2021 වර්ෂ වල අයවැය මඟින් ලබා දී තිබුණි. එමෙන්ම 2023 වර්ෂය සඳහාද අයවැය මඟින් රු. මිලියන 47 ක මුදලක් ලැබුණි. එම සම්පූර්ණ මුදල වන රු මිලියන 423.7 ක මුදල චක්‍රිය අරමුදලක් ලෙස 2024 වර්ෂයේද, දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිති සහ විවිධ සේවා සමූපකාර සමිති වෙත වී මිලදී ගැනීමේ කටයුතු සඳහා කාරක ප්‍රාග්ධනය ලෙස භාවිතා කිරිමට ලබා දී ඇත.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතීන්

(අ) ව්‍යාපෘතියේ නම - නැවුම් එළවලු හා පළතුරු ගබඩා කිරීම සඳහා උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද මෙට්‍රික් ටොන් 5000 ක ධාරිතාවයෙන් යුතු ගබඩා සංකීර්ණයක් දඹුල්ල ප්‍රදේශයේ ඉදි කිරීම.

(ආ) දායක නියෝජිතායතන - ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා මධ්‍යම රජය

(ඇ) මෙම ව්‍යාපෘතියේ මූලික මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 525ක් (මින් රුපියල් මිලියන 300 ක් ඉන්දීය රජයේ ඍජු ප්‍රදානයකි) වුවත් ආර්ථික අර්බුදය හේතුවෙන් විනිමය අනුපාත වල සිදු වූ වෙනස්කම් නිසා ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම සහ ආනයනය කොට සවි කල යුතු භාණ්ඩ සහ උපකරණ වල ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදුවන අතර ඒ සඳහා සහ මිල උච්ඡාවචනය හේතුවෙන් අවශ්‍ය වී ඇති අතිරේක ප්‍රතිපාදන රු. මිලියන 132 ක් බව ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ නව මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 657ක් වේ.

(ඇ) ව්‍යාපෘති කාල සීමාව - 2019 මාර්තු 30 දින වැඩ ආරම්භ කර මාස 06 ක කාල සීමාවක් තුළ අවසන් කිරීමට යෝජිත වූ මෙම ව්‍යාපෘතිය කොවිඩ් 19 හදිසි වසංගත තත්ත්වය නිසා සිදු වූ අනපේක්ෂිත තත්ත්වයන්, ව්‍යාපෘතිය කරගෙන යාමේදී මතු වූ තාක්ෂණික ගැටලු සහ ආර්ථික අර්බුධය නිසා මෙතෙක් අවසන් කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2025 වසරේදී අවසන් කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

ගබඩා සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු අතරතුර

ගබඩා සංකීර්ණය ඉදිකිරීමෙන් පසුව දිස්වන අයුරු

(02) ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ජයග්‍රහණ

දෙපාර්තමේන්තුව සතු ගබඩා 53 ක් රාජ්‍ය හා පුද්ගලික අංශ වෙත සහ ත්‍රිකුණාමල ධාන්‍යගම නිවාස සංකීර්ණයෙහි පිහිටි නිවාස සහනදායී කුලී පදනම යටතේ ලබා දීමෙන් රුපියල් මිලියන 144.5 ක මුදලක් 2024 වසරේදී රාජ්‍ය ආදායමට බැර කිරීමට හැකි විය. ආර්ථික දුෂ්කරතාවයන් නිසා බලපෑමට ලක් වූ පවුල් සඳහා විදේශවලින් ලැබුණු ආධාර රජය වෙනුවෙන් භාරගෙන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත භාර දීමේ කාර්යය මනා සම්බන්ධීකරණයෙන් යුතුව ඉටු කර ඇත.

ඉදිරි ඉලක්ක

නැවුම් එළවලු හා පළතුරු ගබඩා කිරීම සඳහා උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද දඹුල්ල ප්‍රදේශයේ ඉදිකෙරෙමින් පවතින මෙට්‍රික් ටොන් 5,000 ක ධාරිතාවයෙන් යුතු ගබඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු 2025 වසරේදී නියමිත පරිදි නිමකර එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර ජනතාව වෙත පවරා දීමට යෝජිතය. තවද දෙපාර්තමේන්තුව සතු වත්කම් ආර්ථික වශයෙන් ඵලදායී ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇති අතර ඒ අනුව ගබඩා නවීකරණය කිරීම හා දැනට උපයෝජනය කර නොමැති ගබඩා සහ ඉඩම් පෞද්ගලික අංශය සමඟ ද සම්බන්ධීකරණයෙන් රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමට අපේක්ෂිතය.

ලාල් හේවාපතිරණ
ආහාර කොමසාරිස් (රාජකාරි ඉටුකරන)
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

(03) මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	තතය 2,024	- 2,023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	ඒසීඒ-1
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		175,943,289	211,799,000	ඒසීඒ-3
-	තැන්පතු		82,143,182	28,649,921	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම		5,133,998	8,594,209	ඒසීඒ-5
	VAT		21,144,509	15,627,049	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**284,364,978**	264,670,179	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**284,364,978**	264,670,179	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		92,541,298	1,035,476	
	භාණ්ඩාගාර අත්තිකාරම්				
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඈ)-(ඇ)		191,823,680	263,634,703	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
53,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	44,164,562	44,732,023	ඒසීඒ-(ii)
65,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	51,508,439	37,008,801	
500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	298,052	396,370	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	

	VAT		34,952,232	16,281,702	
119,500,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**130,923,286**	**98,418,896**	
	මූලධන වියදම්				
13,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	**10**	631,050	1,599,860	
301,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	138,013,071	15,612,067	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසීඒ-(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
500,000	හැකියා වර්ධනය	**14**	173,767	199,667	
	වෙනත් මූලධන වියදම්	**15**	-	47,693,274	
314,500,000	**මුළු මූලධන වියදම් (උ)**		**138,817,888**	65,104,868	
	තැන්පතු ගෙවීම්		11,714,936	17,573,120	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		2,994,130	8,500,693	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		14,709,066	26,073,813	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		284,450,240	189,597,577	
434,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(92,626,560)	74,037,126	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(92,736,618)	(74,037,126	**ඒසීඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		110,058	-	**ඒසීඒ-3**

3.2

ඒසීඒ - 7

අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය

වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම	0	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම්	82,050,177	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම්	-	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්	1,180,201	**83,230,378**
අඩු කළා :		
අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම්	173,062,450	
වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම්	2,747,129	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම්	157,417	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම්	-	175,966,996
2024 දෙසැම්බර් **31** දිනට අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය		**92,736,618**

* ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව **ඒසීඒ-8**
2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තතය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	4,942,673,946	4,912,480,145
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	231,509,023	116,632,271
මුදල් හා මුදල් සමාන ද්‍ර	ඒසීඒ-3	110,058	-
මුළු වත්කම්		**5,174,293,027**	**5,029,112,416**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(180,543,381)	(108,547,616)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		4,942,673,946	4,912,480,145
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	220,452,214	104,007,943
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	191,600,190	121,171,944
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	110,058	-
මුළු වගකීම්		**5,174,293,027**	**5,029,112,416**

පිටු අංක 7 සිට 33 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 34 සිට 39දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
දිනය : 24/02/2025	දිනය : 2025/2/20	දිනය : 2025.02.20

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

ඩී.ඩී. උපුල් ශාන්ත ද අල්විස්
ආහාර කොමසාරිස්
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
330, යූනියන් පෙදෙස,
කොළඹ 02.

ඩී.යූ.ඒ වදිරසිංහ
ප්‍රධාන ගණකාධිකාරි (වැ.බ)
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
අංක. 330, යූනියන් පෙදෙස,
කොළඹ 02.

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2024 රු.	2023 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	173,062,450	133,239,117
අග්‍රිම ලැබීම්	175,943,289	211,799,000
අත්තිකාරම් අයකර ගැනීම්	4,111,214	6,967,324
තැන්පතු ලැබීම්	82,143,182	28,649,921
VAT	21,144,509	15,627,049
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**456,404,644**	**396,282,411**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	92,925,873	80,865,204
සහනාධාර සහ මාරුකිරීම්	298,052	396,370
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	82,050,177	208,324,506
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	92,541,298	1,035,476
අත්තිකාරම් ගෙවීම්	2,994,130	8,500,693
තැන්පතු ගෙවීම්	11,714,936	17,573,120
VAT ගෙවීම්	34,952,232	16,281,702
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**317,476,698**	**332,977,070**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**63,305,342**

(ඇ)=(අ)-(ආ)	**138,927,946**	
<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
මූලධන වියදම්	138,817,888	63,305,342
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	138,817,888	63,305,342
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(138,817,888)	(63,305,342)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**110,058**	**-**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**110,058**	**-**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

නොමැත

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.01.01	නිල නිවාස හා ගබඩා	182,733.907	175,443.235	144,508.342	82.36%

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	119,500	119,500	95,971.054	80.3%
ප්‍රාග්ධන	314,500	314,500	138,817.888	44.13%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	ජනාධිපති ලේකම් කාර්යාලයේ ලෝක ආහාර වැඩසටහනේ සහයෝගීතාව සඳහා වූ හවුල්කාරීත්ව ලේකම් කාර්යාලය	ආහාර බෙදාහැරීම් කටයුතු ඉටු කිරීම	50,788,799.73	50,788,799.73	49,263,034.61	96.99%
		ඔරුගොඩවත්ත 06 ගබඩාව නවීකරණය	45,474,288.70	45,474,288.70	32,359,786.61	71.16%
02	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම වැටුප් ගෙවීම	309,500.00	309,500.00	309,500.00	100%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්වය වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	3,489,301.978	3,489,301.978	-	100 %
9152	යන්ත්‍රෝපකරණ	41,596.467	41,596.467	-	100 %
9153	ඉඩම්	1,411,775.50	1,411,775.50	-	100 %
9160	කෙරීගෙන යන වැඩ	220,452.214	220,452.214	-	100 %

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊජ්සී/සී/එෆ්ඩී/එෆ්ඒ/2024   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

ආහාර කොමසාරිස්,

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 300 ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම

1

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 සහ 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

3

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

(අ) එකතු කල අගය මත බදු ගිණුම්ගත කිරීමේදී යෙදවුම් මත බදු හා නිමැවුම් මත බදු හිලව් කර ශුද්ධ එකතු කල අගය මත බද්ද මූල්‍ය වත්කම් හෝ ජංගම වගකීම් යටතේ දැක්වීම වෙනුවට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ යෙදවුම් මත එකතු කල අගය මත වූ බද්ද රු.34,952,232 ක් පුනරාවර්තන වියදම් යටතේ සහ නිමැවුම් මත එකතු කල අගය මත බද්ද වූ රු.21,144,509 ක් ආදායම් නොවන ලැබීම් යටතේ දක්වා තිබුණි. ඒ අනුව ශුද්ධ යෙදවුම් බද්ද රු.13,807,723 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් ලෙස දක්වා නොතිබුණි. තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ යෙදවුම් මත එකතු කල අගය මත බද්ද හා නිමැවුම් මත එකතු කළ අගය මත බද්ද මෙහෙයුම් ක්‍රියාකාරකම්වල කාරක ප්‍රග්ධන වෙනස්වීම් යටතේ දැක්වීම වෙනුවට පිළිවෙළින් මුදල් ගලායාමක් හා මුදල් ගලා ඒමක් ලෙස වෙන වෙනම දක්වා තිබුණි.

(ආ) එක් සමුපකාර සමිතියකින් සමාලෝචිත වර්ෂය තුල අයකරගෙන තිබූ රු.4,315 ක් මූල්‍ය ප්‍රකාශනවල පොත් වලින් කපා හැරීමේ ප්‍රකාශනයේ ඇමුණුම ii හි රු.60,000 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.55,685 ක වෙනසක් පැවතුණි.

1.6.2 මූලධන වියදම්

දඹුල්ල උෂ්ණත්ව පාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 300-01-02 2104 යන මූලධන වැය ශීර්ෂය සඳහා වෙන්කර තිබුණු රු.300,000,000 ක ප්‍රතිපාදනයෙන්

රු.116,444,271 ක් වැය කර එය කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමට ගලපා තිබුණ ද එම වැය විෂය යටතේ ඊට අදාළ නොවන රු.439,370 ක් වූ ආහාර පාන, ගමන් ගාස්තු, සංග්‍රහ ගාස්තු, ඉන්ධන හා නවාතැන් ගාස්තු ආදී පුනරාවර්තන වියදම් ද ඊට ඇතුලත් කර තිබුණි.

1.6.3 මූල්‍ය වත්කම්

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව ආරම්භක ශේෂයන්ගේ වෙනස රු.572,349 ක් විය. තවද රු.332,249 ක ශේෂයක් වසර 11 කට පමණ පෙර සිට පැවත එන අතර 2024 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අත්තිකාරම් බී ගිණුමේ ඇමුණුම 3.7 අනුව සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂයන්ගේ එකතුව රු.706,935 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ (ඇමුණුම-i) එම ශේෂය රු.709,235 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.2,300 ක වෙනසක් පැවතුණි.

(ඇ) අත්තිකාරම් බී ගිණුමෙහි ඇමුණුම 3.1 හි සඳහන් කේවල ණය ශේෂ සහ 2024 වර්ෂයේ සාමාජික ණය ලේඛණයේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ අතර නිලධාරීන් තිදෙනෙකුට අදාලව ආපදා ණය සම්බන්ධයෙන් රු.203,422 ක වෙනසක්ද එක් නිලධාරියෙක්ට අදාලව උත්සව අත්තිකාරම් සම්බන්ධයෙන් රු. 1,250 ක වෙනසක්ද පැවතුණි.

(ඈ) සේවය අතහැර ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.706,935 ක ණය ශේෂයක් තුල නිලධාරීන් 03 දෙනෙකුගේ රු.366,160 ක ණය ශේෂ වර්ෂ 10 ට වඩා ද නිලධාරීන් 04 දෙනෙකුගේ රු.168,695 ක ශේෂය වසර 20 කට වඩාද පැරණි වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

වැය විෂයයන් 20 ක් සඳහා වූ සංශෝධිත අයවැය ප්‍රතිපාදනයන් සියයට 19 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවතීමෙන් මුදල් රෙගුලාසි 50 අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,132,706 ක බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. තවද වැය විෂයයන් දෙකක් සම්බන්ධයෙන් ඉතිරිය ඉක්මවා රු.460,575 ක බැදීම් ඇතිකර ගෙන තිබුණි.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතායට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1.4 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු

6

වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

(ඇ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවක් තුල සියළුම විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදය	
(i) 4.2.4 හා 4.2.5 වගන්ති	විශ්‍රාම් ගිය නිළධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වසර 10 ඉක්ම වූ රු.149,619 ක ආපදා ණය ශේෂයක් පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල් වලින් හෝ මාසික විශ්‍රාම වැටුප හා ඊට අදාළ දීමනාවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) 4.4 වගන්තිය	මියගිය නිළධාරියෙකුගෙන් අයවිය යුතු වසර 10 ඉක්ම වූ රු.154,130 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට අදාළව ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට නියමිත ඕනෑම මුදලකින් අඩුකරගන්නා ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වහාම ඉල්ලා සිටිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මුදල් රෙගුලාසි 110	දෙපාර්තමේන්තුව විසින් හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6)	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය අදාළ මුදල් වර්ෂයේ දෙසැම්බර් 15 ට පෙර පත් කළ යුතු වුවද 2023 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මාසයක් පමණ ප්‍රමාද වී එනම්, 2024 ජනවාරි 19 දින පත්කර තිබූ අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට මාස 5 ක් පමණ ප්‍රමාද වී තිබුණි. තවද 2024 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2025 අප්‍රේල් 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(iii)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මගින් සංශෝධිත මු.රෙ 113 (6) (ආ) යටතේ අත්තිකාරම් "බී" ගිණුම මගින් ලබාදුන් ණය හෝ අත්තිකාරම් මුදල් අයකරගැනීමේදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) ඡේදය	වැඩ තහනම් කර ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 20 කට වඩා පැරණි රු.186,123 ක ණය ශේෂය හා එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු වර්ෂ 10 – 20 කාලයක් පැරණි රු.16,504 ක ණය ශේෂයක් ද තවත් නිලධාරියෙකුගෙන් අයවිය යුතු වර්ෂ 3 -5 ක් අතර කාලයක් පැරණි රු.162,920 ක ණය ශේෂයක් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 5 වන ඡේදය	2017 මැයි 11 දිනෙන් පසු ධාන්‍යාගම නිවාස සංකීර්ණය සම්බන්ධයෙන් තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක; 30/2016

(i) 3.1 ඡේදය	දෙපාර්තමේන්තුවේ මෝටර් රථ 05 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.
(ii) 3.3 ඡේදය	ඇමුණුම 01 ආකෘතිය පරිදි වාහන සම්බන්ධයෙන් ප්‍රවාහන සේවා සටහනක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

3.5 තැන්පතු

(අ) 2024 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුම් 3 කට අදාළව රු. 191,600,190 ක ශේෂයක් පැවතුණි. එම ශේෂය තුළ වසර 2 ත් 5 ත් අතර රු. 32,825,394 ක ශේෂයක් ද වසර 5 ත් 10 ත් අතර රු. '27,031,903 ක ශේෂයක් ද වසර 10ට වැඩි රු.27,442,800 ක ශේෂයක් ද වූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) හා 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට නිවාස හා ගබඩා කුලී වෙනුවෙන් තබාගන්නා ඇප තැන්පතු සඳහා වූ තැන්පතු ගිණුමේ (6000-0-0-13-0-131) නිවාස පදිංචිය වෙනස් වුවද නිදහස් නොකර දීර්ඝ කාලයක සිට පවතින රු. 293,716 ක ඇප මුදල් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.

(ඇ) ඇප තැන්පත් ගිණුම් අංක 6000-0-0-1-0-125 හි ඇප තැන්පත් නොවන රු.732,381 ක වෙනත් තැන්පතු ද ඇතුලත් කර තිබුණි.

3.6 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි 2024 දෙසැම්බර් 31 දිනට අවස්ථා 80 කට අදාලව හඳුනා නොගත් ලැබීම් රු. 3,120,233 ක් වූ අතර එම ලැබීම් තුළ වසර 04 සිට මාස 01 දක්වා පැරණි ශේෂයන්

9

පැවතිණි. තවද නිරවුල් නොවූ රු.737,500 ක ලැබීම් දෙකක් පැවති අතර ඒවා අවුරුදු 19 හා අවුරුදු 03 ඉක්ම වූ ලැබීම් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1.1. දැක්ම හා මෙහෙවර

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස හඳුනාගෙන තිබූ දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීම අනුව මෙට්‍රික් ටොන් 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම යන කාර්යය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබූ අතර කිසිදු සහල් සංචිතයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව ආරක්ෂිතව, අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සැම නිවසකටම යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවිය.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

තොරතුරු තාක්ෂණ ශාඛාව මඟින් මහජනතාවට යාවත්කාලීන තොරතුරු සැපයීම අරමුණු කරගෙන දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුව යාවත්කාලීන කිරීම ක්‍රියාකාරී සැලැස්ම තුළින් හඳුනාගෙන තිබුණද විගණිත දිනය වූ 2025 මාර්තු 26 වන විටත් දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුව යාවත්කාලීන කර නොතිබුණි.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීම හෝ ශුන්‍ය කිරීම හා රසායනික භාවිතය සඳහා වැය වන පිරිවැය අවම හෝ ශුන්‍ය කිරීම අරමුණු කරගෙන විද්‍යාත්මක ගබඩා ඉදිකර තිබුණ ද ලෝක ආහාර වැඩසටහන යටතේ ආධාර ලෙස ලැබී බෙදාහරින තුරු ගබඩාවන්හි ගබඩා කර පැවති ආහාර සඳහා 2024 වර්ෂයේ දී ධූමායන වාර 10 ක් සිදු කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.1,633,372 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. ඒ අනුව රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීම යන අරමුණ ඉටු වී නොතිබුණි.

4.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය

ප්‍රකාරව සියළුම ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු වුවද 2022 සහ 2023 වර්ෂ වලට අදාළ වාර්ෂික කාර්යයසාධන වාර්තා 2025 අප්‍රේල් 30 දින වන විට ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) සමාලෝචිත වර්ෂය තුළදී රු.199,184 ක් (VAT සහිතව) වටිනා බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රයක්(Multimedia Projector) හා තිරයක් මිල දී ගැනීමේදී ආයතන 03 කින් මිල ගණන් කැඳවා තිබුණ ද එම මිල ගණන් කැඳවූ ආකාරය විගණනයට අනාවරණය නොවූ අතර අයිතමයට තිබිය යුතු පිරිවිතරයන් ද තීරණය කර නොතිබුණි. තවද මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන විසින් තම අත්සන යොදා ඒවා සහතික කර නොතිබූ අතර මිල ගණන් විවෘත කළ දිනයන් පිළිබඳ තොරතුරු ද අනාවරණය නොවුණි. ඒ අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන අනුව විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුව මෙම ප්‍රසම්පාදනය සිදු කර නොතිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ඇ) ඡේදය අනුව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කාර්යය පටිපාටිය අනුගමනය කරන විට අදාළ මිල දී ගැනීම් සිදු කිරීමේදී එම ලියාපදිංචි ලැයිස්තුවෙහි දැක්වෙන ආයතනවලට සීමා කළ යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි සැපයුම්කරුවෙක් නොවූ ආයතනයකින් රු.80,000 ක් වටිනා ටෝනර් මිලදී ගෙන තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුවට අයත් වේයන්ගොඩ ගබඩා සංකීර්ණයේ පිහිටි මෙට්‍රික් ටොන් 16,330 ක ධාරිතාවයෙන් යුත් ගබඩා 06 ක් 2025 අප්‍රේල් 30 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි.

(ආ) ධාරිතාවය මෙට්‍රික් ටොන් 16920 ක් වූ වර්ග අඩි 78,000 ක ප්‍රමාණයේ භාවිතයට නුසුදුසු ගබඩා 04 ක් නවීකරණය කර භාවිතයට නොගෙන පවතින කාලය වසර 04 සිට වසර 12 දක්වා වී තිබුණි.

11

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඈ) ධාරිතාවය මෙට්‍රික් ටොන් 8405 ක් හා වර්ග අඩි 37353 ක ප්‍රමාණයේ වූ ගබඩා 05 ක් අළුත්වැඩියා කල යුතු තත්ත්වයේ තිබුණු අතර ඒවා ද අළුත්වැඩියා කර සංචිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී වේයන්ගොඩ අංක 06 දරන ගබඩාව රු.3,495,536 ක් වැය කර රසායනාගාරයකට පරිවර්තනය කර තිබුණ ද එම රසායනාගාරය 2025 අප්‍රේල් 30 දින වන විට වසර ගණනාවක් තිස්සේ නිෂ්කාර්යව පැවති අතර 2024 නොවැම්බර් 06 දින එහි පැවති රසායනාගාර උපකරණ වෙන්දේසි කර තිබිණි.

(ඉ) වේයන්ගොඩ ගබඩා සංකීර්ණයේ පවතින පාලම් තරාදිය වසර ගණනාවක් තිස්සේ නිෂ්කාර්යව පැවති අතර අළුත්වැඩියා කර වෙනත් ආයතන වලට කුලියට ලබාදීමෙන් ආදායමක් ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. එහි උපාංග ඇතුලත් කාමරයේ වහලය ගැල වී තිබුණු අතර එහි උපාංගවල ආරක්ෂාවට හා පැවැත්මට තර්ජනයක් වී තිබුණි.

(ඊ) නිවාස 366 කින් යුතු ධාන්‍යාගම නිවාස සංකීර්ණයට අයත් භූමිය පවරා නොගෙන වසර 43 ක් ද මෙහි මැනුම් කටයුතු 2021 ජූලි 07 දින සිදුකර වසර 03 කට අධික කාලයක් ද ගත වී තිබුණි. නිවාස සංකීර්ණයේ නිවාස 28 ක් අබලන්ව පැවති අතර ඒවා අලුත්වැඩියා කර කුලියට ලබාදීමට කටයුතු නොකිරීම හේතුවෙන් ලබාගත හැකිව තිබු ආදායම් අහිමි වී තිබුණි. මෙම නිවාස වලින් නිවාස 27 ක් වසර 01 සිට වසර 14 දක්වා කාලයක් අබලන්ව පවතින අතර එක් නිවාසයකට අදාළව අබලන්ව පවතින කාලය විගණනයට ඉදිරිපත් නොවුණි.

4.4. පාඩු හා හානි

(අ) ආහාර මුද්දර, භූමිතෙල් මුද්දර, සහල්, පිටි, සීනි හා වෙනත් වශයෙන් සමුපකාර සමිති 156 කට ලබාදුන් ණය මුදල් වලින් 2024 දෙසැම්බර් 31 වන විට රු.154,855,604 ක ශේෂයක් අයවිය යුතුව පැවති අතර මූල්‍ය ප්‍රකාශන අනුව මෙම ණය මුදල් වසර 10 කට වඩා පැරණි ණය ශේෂ විය. මේ වන විට සමුපකාර සමිති එකකින් පමණක් වාරික මුදල් අය වෙමින් පවතින අතර අයනොවන ණය මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව නිරීක්ෂණය නොවුණි.

12

(ආ) වසර 10 කට වැඩි කාලයක සිට අය නොවී පවතින ගබඩා භාරකරුවන් 225 දෙනෙකුගෙන් අයකර ගත යුතු අධිභාර වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට රු.45,721,968 ක් වූ අතර අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන ඇති බව නිරීක්ෂණය නොවුණි.

(ඇ) වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩා 03 ක ලෝක ආහාර වැඩසටහනට අයත් සහල්, පරිප්පු, රටඉඳි, එළවළු තෙල් යන ආහාර ද්‍රව්‍ය පාසල් දරුවන් හා අඩු ආදායම්ලාභී පවුල් වෙත ලබාදීම සඳහා ගබඩා කර පැවති අතර එම භාණ්ඩ ලැබුණු කාලය අනුව 2024 නොවැම්බර් 19 දිනට වර්ෂ 01 මාස 08 සිට මාස 08 දක්වා කාලයක් බෙදා හැරීමෙන් තොරව ගබඩා කර තබා ගැනීමෙන් විනාශ වීමේ අවදානමක පැවතුණි.

(ඇ) ලෝක ආහාර වැඩසටහන යටතේ ලැබී තිබුණු රටඉඳි තොගයක් නියමිත දිනට නිෂ්කාශනය කිරීමට නොහැකිවීම හේතුවෙන් රු.398,909 ක ප්‍රමාද ගාස්තුවක් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ගෙවීමට සිදු වී තිබුණි.

(ඉ) ලෝක ආහාර වැඩසටහන යටතේ ලැබී තිබුණු සහල් කිලෝග්‍රෑම් 297 ක්, පරිප්පු කිලෝග්‍රෑම් 3385 ක් හා එළවළු තෙල් කෑන් 152 ක් සත්ව ආහාර ලෙස සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත නිකුත් කර තිබුණු අතර තවත් සහල් කිලෝග්‍රෑම් 40 ක්, පරිප්පු කිලෝග්‍රෑම් 600 ක් හා එළවළු තෙල් කෑන් 21 ක් නෂ්ට වීම් ලෙස හඳුනාගෙන තිබුණි.

4.5 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂයට අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 08 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ලබා දී නොතිබුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

(අ) දෙපාර්තමේන්තුවේ ගබඩා ගොඩනැඟිලි බාහිර පාර්ශවයන්ට බදුදීමේදී ගිවිසුම් ප්‍රකාරව බදු ගැනුම්කරු විසින් ජලය, දුරකථන හා විදුලිය සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවිය යුතු වුවද ආයතන 08 ක් සම්බන්ධයෙන් මාස 50 සිට මාස 02 දක්වා කාල පරාසයකට අදාලව රු. 35,719,639 ක විදුලි බිල්පත් ද මාස 47 සිට මාස 02 දක්වා කාල පරාසයකට අදාලව රු.1,706,867 ක ජල බිල්පත් ද ලෙස එකතුව රු. 37,426,506 ක් අයකර ගෙන නොතිබුණි.

13

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) 2018 ජූලි 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පළතුරු, එළවළු, ඇණු සහ අනෙකුත් ආර්ථිකමය වශයෙන් වාසිදායක බෝගවල මිල උච්චාවචනය අවම කිරීම සඳහා මෙට්‍රික් ටොන් 5000 ක ධාරිතාවයකින් යුතු උෂ්ණත්ව පාලක ගබඩා පහසුකමක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2019 ජූනි 26 දින ආහාර කොමසාරිස්වරයා සහ කොන්ත්‍රාත්කරු සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව මාස 06 කින් අවසන් කළ යුතු ව්‍යාපෘතිය සඳහා අවුරුදු 5 කට අධික කාලයක් ගතකර තිබුණ ද 2025 අප්‍රේල් අවසන් වන විටත් වැඩ අවසන් කර භාරදී නොතිබුණි. එසේම ගබඩාවේ කටයුතු පවත්වාගෙන යාම හා කළමනාකරණය සඳහා ආයතනයක් තෝරා ගැනීම වෙනුවෙන් 2024 ජූලි 28 හා 2024 අගෝස්තු 23 දෙදින තුළ පුවත්පත් 06 ක දැන්වීම් පළ කර රු.261,287 ක් ගෙවා තිබුණ ද විගණිත දිනය වූ 2025 අප්‍රේල් 30 දින වන විටත් ඒ සඳහා ආයතනයක් තෝරා ගෙන නොතිබුණි. තවද ගබඩා උපයෝජනයේදී නිකුත් කරනු ලබන මළ අප ජලය බැහැර කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් විගණිත දින වන විටත් සකස් කර නොතිබුණි.

(ii) මෙම ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම භාවිතා කිරීමටත් එහි අයිතිය ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත පැවරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණ ද වසර 06 ක පමණ කාලයක් ගත වී ඇතත් 2025 අප්‍රේල් 30 දින වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2022 ඔක්තෝබර් 22 දින පවත්වන ලද රජයේ ගිණුම්කාරක සභාව විසින් මෙම ගබඩා සංකීර්ණය සඳහා සූර්ය පැනල සවි කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස නිර්දේශ කර තිබුණ ද මේ වනවිට වසර 02 ක් ඉක්මවා තිබුණද ඊට අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iv) මුළු ධාරිතාවය මෙ.ටො. 5000 කින් යුතු මෙම ගබඩාවේ ද්‍රව්‍ය වල බර මැනීම සඳහා වරකට මෙ.ටො. 02 ක් මැනිය හැකි බිම් තරාදි 06 ක් පමණක් ස්ථාපිත කර තිබුණු අතර ගබඩා ද්‍රව්‍ය ප්‍රධාන ගබඩාවට යොමුකිරීමට පෙර සිසිලන ඒකකයේ හා නිකුත් කිරීමට පෙර පශ්චාත් තාපන ඒකකයේ පැය 4-5 ක කාලයක් ඒවා තැබිය යුතු වුවද එම ඒකක 2 හි ධාරිතවය මෙ.ටො. 12 ක්

14

පමණක් වීම හේතුවෙන් ගබඩාව සම්පූර්ණයෙන් පිරවීම සඳහා අවම වශයෙන් දින 83 ක පමණ දීර්ඝ කාලයක් ගත කිරීමට සිදුවන බව නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) 2020 අප්‍රේල් 29 දිනැති අංක අමප/20/0722/218/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව විවෘත වෙළෙඳපල තුළ සහල් හිඟයක් ඇතිවීම වැළැක්වීම පිණිස වී තොග යොදා ගනිමින් සහල් නිපදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කඩිනමින් ණය සහන ලබාදීමේ වැඩසටහන මඟින් 2020 සිට 2024 දක්වා රු.මි.423.7 ක ණය මුදලක් ලබාදීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගිවිසුමේ iii ඡේදය ප්‍රකාරව ණය මුදල ලබා ගත් දින සිට මාස 06 ක් ඉක්මවීමට ප්‍රථම ගෙවා නිම කිරීමට සමුපකාර සමිති විසින් එකඟ වී තිබුණ ද 2025 අප්‍රේල් අවසන් වන විට රු.මිලියන 301.387 ක ණය ශේෂ ගෙවා නිමකර නොතිබුණි. තවද ගිවිසුමේ 3 vii ඡේදය ප්‍රකාරව මසකට සියයට 1.5 බැගින් ප්‍රමාද ගාස්තු ද අයකර ගෙන නොතිබුණි.

(ii) ගිවිසුමේ 1 (ii) වගන්තිය ප්‍රකාරව රජයට ඇති ණය පියවීමට අදාළ සියලු නෛතික කටයුතු සිදු කිරීමට පළමු පාර්ශවය වන ආහාර කොමසාරිස්වරයා වගකීමෙන් බැඳී සිටිය ද අවුරුදු 03 මාස 07 සිට මාස 05 දක්වා කාලයක සිට නොගෙවා පවතින ඉහත ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර අයකර නොගත් ණය ශේෂය ලබාදුන් ණය මුදලේ ප්‍රතිශතයක් ලෙස සියයට 75 ක් වී තිබුණි.

(iii) අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෝල් හිමියන්ට දෙන ණය, චක්‍රීය ණය ලෙස භාවිත කිරීමට අනුමැතිය ලබා දී නොතිබුණ ද එම ණය චක්‍රීය ණය ලෙස භාවිතා කර තිබීමෙන් ගිවිසුම් ප්‍රකාරව ණය ලබා දී මාස 06 ක් පිරුණු වහාම එම මුදල් මහා භාණ්ඩාගාරයට පියවීමට දෙපාර්තමේන්තුව ක්‍රියාකර නොතිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට රු. 72,109,209 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

15

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) 2024 ජනවාරි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 02 ක කාලසීමාවක් සඳහා ආපනශාලාව බදු දී තිබූ අතර මාස 3 ක ප්‍රමාදයකින් පසු 2024 අප්‍රේල් 01 දින බදුකරු වෙත ආපනශාලාව භාරදීම හේතුවෙන් එම මාස 03 සඳහා වූ රු.354,000 ක බදු කුලියක් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. තවද ආපනශාලාව සඳහා 2024 අප්‍රේල් සිට 2024 ඔක්තෝබර් දක්වා මාස 07 සඳහා වූ (බදු සහිත) රු.995,330 ක කුලිය අයකර ගෙන නොතිබූ අතර ගිවිසුම ප්‍රකාරව හිඟ කුලී සඳහා අයකළ යුතු ප්‍රමාද ගාස්තුව ද ගණනය කර අයකරගෙන නොතිබුණි. එසේම ගිවිසුම් ප්‍රකාරව තැබිය යුතු සියලුම ආහාර මිලදී ගැනීම සඳහා තබා නොතිබූ අතර සුභසාධන මිල යටතේ ලබාදීමක් ද සිදු නොවන බව 2024 ඔක්තෝබර් 08 දින ආහාර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර නිරීක්ෂණ වාර්තාවේ දක්වා තිබුණි. තවද ගිවිසුමේ 9 වන වගන්තිය අනුව ආපනශාලා පරිශ්‍රයේ පරිභෝජනය කරන විදුලිය, දුරකථන සහ ජලය සඳහා වූ බිල්පත් බදුකරුගෙන් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඉ) 2024 ඔක්තෝම්බර් 31 දිනට ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ දැනට පදිංචි නිවාස 121 කින් හා නීතිමය ක්‍රියාමාර්ග ගෙන පවරා ගන්නා ලද නිවාස 10 ක පදිංචිකරුවන්ගෙන් එකතුව රු.3,493,567 ක නිවාස කුලියක් ද නීතිමය කටයුතු සිදු කරමින් පවතින නිවාස 23 ක පදිංචිකරුවන්ගෙන් 2024 ජුනි 30 දිනට රු.1,552,156 ක නිවාස කුලියක් ද අයකරගෙන නොතිබුණි.

(ඊ) 2024 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් කුලියට දී ඇති ගබඩා හා පරිශ්‍ර 32 ක් සඳහා පෞද්ගලික අංශයේ ආයතන 15 කින් රු.36,634,171 ක් ද, ගබඩා 21 ක් සඳහා රාජ්‍ය ආයතන 07 කින් රු.75,767,880 ක් ද, සන්තකය ලබා ගැනීම හා හිඟ ගබඩා කුලී අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති ගබඩා 04 ක් සම්බන්ධයෙන් ආයතන 04 කින් රු.30,751,840 ක් ද, කුලියට ලබා දී නැවත පවරාගෙන තිබුණු ගබඩා 27 ක් සම්බන්ධයෙන් රු.47,121,615 ක් ද වශයෙන් රු.190,275,506 ක හිඟ ගබඩා කුලී අයකරගෙන නොතිබුණි.

(උ) පෞද්ගලික අංශය වෙත ගබඩා ගොඩනැඟිලි 03 ක් හා රාජ්‍ය අංශයේ ආයතන 02 කට ගබඩා 02 ක් ගිවිසුම් රහිතව කුලී පදනම මත ලබා දී තිබූ අතර රාජ්‍ය අංශයේ ආයතන 07 කට ධාරිතාව මෙට්‍රික් ටොන් 43,645 ක වර්ග අඩි 250701 ක් වූ ගබඩා 18 ක් සඳහා කුලී අයකිරීමෙන් තොරව කිසිදු ගිවිසුමකින් ද තොරව ලබා දී තිබුණි.

16

(ඉ) 2023 වර්ෂයේ ගබඩා හා නිවාස සඳහා අයවිය යුතු සමස්ථ හිඟ කුලිය රු.116,346,863 ක් වූ අතර 2024 වර්ෂයේ දී එය රු.196,946,397 ක් දක්වා රු.80,599,534 කින් ඉහල ගොස් තිබුණු අතර පෙර වර්ෂයට සාපේක්ෂව එහි වැඩිවීම සියයට 69 ක් වී තිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

(අ) දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 208 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 53 ක් වූයෙන් 159 ක සේවක පුරප්පාඩු පැවතුණු අතර රිය සහකරු තනතුරේ සේවකයන් 04 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 2310/29 හා 2022.දෙසැම්බර් 14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව කාර්ය පටිපාටික රීති 01 වන කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධාන වලට අනුව ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පටිපාටියේ 2.2.2 ඡේදය ප්‍රකාරව එකම සේවා ස්ථානයේ වසර 05කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් කල යුතු වුවද දෙපාර්තමේන්තුවේ වසර 07 සිට 33 දක්වා සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරීන් 08 දෙනෙකු සම්බන්ධයෙන් එලෙස ක්‍රියා කර නොතිබුණි.

එස් .එම්.සී.ඉන්දිකා
ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති
වැඩබලන විගණකාධිපති වෙනුවට

17

(04) කාර්යසාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස (%) තත්‍ය නිමැවුම		
	100 %-90%	75%-89%	50%-74%
මෙ.ටො. 100,000 ක ආරක්ෂිත සහල් සංචිතය	-	-	-
වෙළඳපොළ සහල් සුලභතාවය	-	-	(50%) සුලු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ගේ සහල් නිෂ්පාදනය කිරීමේ වැඩසටහන අධීක්ෂණය කිරීම මඟින් වෙළඳපොල තුළ සහල් සුලභතාවය පවත්වා ගැනිමට දායක විය.
ආයතනයේ සම්පත් මනා කළමනාකරණය සඳහා අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු	(82%) ගබඩාවන් සහ නිවාස කුළියට ලබා දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වයක් දැක්වීම	-	-

(05) තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50-74	75-100
කුසගින්න අවසන් කිරීම (Zero Hunger)	*ආහාර මිළ උච්ඡාවචනය වැළැක්වීම	*එළවලු සහ පළතුරු ගබඩා කිරීමට උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද ශීතාගාර සංකීර්ණයක් ඉදිකිරීම ඇරඹීම.			✓
	*ආහාර සංචිත පවත්වා ගැනීම	*සහල් ආරක්ෂිත සංචිත පවත්වා ගැනීම සඳහා විද්‍යාත්මක ගබඩාවන් ඉදි කිරීම සහ පවත්වා ගැනීම			✓

5.2 තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන අරමුණ වනුයේ කුසගින්න අවසන් කරන්න (Zero Hunger) යි.

තිරසර කෘෂිකර්මාන්තය නඟාසිටුවීමේ අරමුණින් සහ පසු අස්වනු හානි අවම කිරීමේ අරමුණින් යුක්තව එළවලු සහ පළතුරු ගබඩාගත කිරීම සඳහා උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය පාලනය කරන ලද ගබඩා සංකීර්ණයක් දඹුල්ල ප්‍රදේශයේ ඉදිකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

වසර 2030 වන විට ජාතික දරිද්‍රතාවේ රේඛාවෙන් පහල ජීවත්වන ජනගහනයේ අනුපාතය අඩකින් අඩු කිරීමට දායක වීමේ අරමුණින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණ සකස් වී ඇත.

(06) මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	06	01	05	_
තෘතීයික	03	01	02	_
ද්විතීයික	109	28	81	_
ප්‍රාථමික	90	23	67	_

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබා ඇති ආකාරය

දෙපාර්තමේන්තුව තුළ අනුමත සේවක සංඛ්‍යාව රාජකාරිවල නිරත වේ නම් වඩා කාර්යක්ෂම සහ ඵලදායී ලෙස රාජකාරි කටයුතු සිදු කිරීමේ හැකියාවක් පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	**සමස්ථ අයෝජනය රු.**	වැඩසටහනේ ස්වභාවය
රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයින් සඳහා කාර්යාලයීය ආචාරවිධි සම්බන්ධ වැඩමුළුව	02	දින 02	26,000	**දේශීය**
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම් සම්බන්ධ වැඩමුළුව	01	දින 01	13,000	**දේශීය**
වාහන කළමනාකරණය	01	දින 01	7,000	**දේශීය**
ලේඛන කටයුතු පිළිබඳ පුහුණුව	02	දින 04	50,000	**දේශීය**
ආනයන අපනයන ක්‍රමවේද	02	දින 02	26,000	**දේශීය**
සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම හා ගෙවීම සම්බන්ධ වැඩමුළුව	01	දින 02	13,000	**දේශීය**
වැටුප් පරිවර්තනය	01	දින 02	13,000	**දේශීය**
පුද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම	01	දින 02	13,000	**දේශීය**

(07) අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01 . පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ				
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	වර්තමානයේ දෙපාර්තමේන්තුවේ මෙම අත්තිකාරම් ගිණුම ක්‍රියාත්මක නොවේ.	ඉදිරියේදී ප්‍රමිතීන් හෝ චක්‍රලේඛ අනුව මෙම අත්තිකාරම් ගිණුම් මෙම දෙපාර්තමේන්තුවට අදාළ වුවහොත් අනුකූල පරිදි සකස් කිරීමට කටයුතු කිරීම
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.6	වෙනත්	අනුකූල නොවේ		
02 . පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)				
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති වීම	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති බැවින් නිසි පරිදි තනතුරක් ඇති කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03 . මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මු.රෙ 135)				
3.1	මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04 .වාර්ෂික සැලසුම් සකස් කිරීම				
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති වීම	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති බැවින් නිසි පරිදි තනතුරක් ඇති කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම්දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05 . විගණන විමසුම්				
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
06. අභ්‍යන්තර විගණනය				
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසරේ ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ජා කිරීමෙන් අනතුරුව ,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති වීම	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති බැවින් නිසි පරිදි තනතුරක් ඇති කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව , සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ වගණන දෙපාර්තමේන්තුවට ඉදාරිපත් කර තබීම	අනුකූල නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		

07 . විගණන හා කළමනාකරණ කමිටු				
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08 . වත්කම් කළමනාකරණය				
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රෙල්බයේ 07 වන පරිච්ජේදය අනුව වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ජේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රෙල්බ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	නියමිත දිනට පෙර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.	නියමිත දිනට සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ	නියමිත කාලය තුළ අවසන් කිරීම සිදුව නැත	නියමිත දිනට සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	නියමිත කාලය තුළ අවසන් කිරීම සිදුව නැත.	නියමිත දිනට අපහරණ කටයුතු සිදු කිරීම
09 . වාහන කළමනාකරණය				
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කිරීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදුවාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10 . බැංකු ගිණුම් කළමණාකරණය				
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොමැත	ඉදිරියේදී නියමිත දිනට පිළියෙල කිරීම
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කිරීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළතනිරවුල් කර තිබීම	අනුකූල වේ		
11 . ප්‍රතිපාදන උපයෝජනය				
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		

12 . රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්				
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබද කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	හිගහිටි ණය ශේෂ පිළිබද කටයුතු කරමින් පවතී	ඉදිරියේදී මු.රෙ. සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව කටයුතු කර තිබීම
13 .පොදු තැන්පත් ගිණුම				
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී	ඉදිරියේදී මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම
13.2	පොදු තැන්පතු සදහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14 . අග්‍රිම ගිණුම				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසදුම් කිරීම	අනුකූල වේ		
15 . ආදායම් ගිණුම				
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබිම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදයමට බැර කර තිබීම.	අනුකූල වේ		

15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16 . මානව සම්පත් කළමනාකරණය				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17 . මහජනයා වෙත තොරතුරු ලබා දීම				
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවියක් හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18 . පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම				
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින්	අනුකූල වේ		

	ක්‍රමවේදයක් සකස් කර තිබීම			
19 . මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ක ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කර තිබීම	අනුකූල වේ		
20 . විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		